00019

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**ESD1131/EPD3331 -** මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන පර්යාලෝක

කාලය - පැය දෙකයි. **(02)**

දිනය - 2023.07.02 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "ප්‍රාථමික අධ්‍යාපනයේ මානව සම්පත් සම්බන්ධව ශ්‍රී ලංකාව ගැටළු රාශියකට මුහුණ දෙමින් සිටියි."

    එම ගැටලු පහක් (05) නම් කරන්න.

02. ළමා කේන්ද්‍රීය අධ්‍යාපනයේ ගුරුභූමිකාව කුමක් ද?

03. "පවුලේ සාම්ප්‍රදායික භූමිකාව වර්තමානයේ වෙනස් වී ඇත."

    මෙම වෙනසට හේතු වූ කරුණු පහක් (05) ලැයිස්තු ගත කරන්න.

04. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් සිසුන්ගේ සාධන මට්ටම අඩුවීම සඳහා බලපාන සාධක පහක් (05) නම් කරන්න.

05. විශේෂ තත්ත්වයන් යටතේ ස්ථාන ගත කර ඇති ළමුන් කාණ්ඩ පහක් (05) ලැයිස්තු ගත කරන්න.

06. "ළමා සොල්දාදුවෙක් යනු හමුදාවක් විසින් බඳවා ගන්නා ලද හෝ හුදෙක් සන්නද්ධ ගැටුමකට සහභාගි වන වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙකි."

    ශ්‍රී ලංකාවේ ළමා සොල්දාදුවන් මුහුණ දෙන ගැටළු මොනවා ද?

07. ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් 1997 දී ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයට නිර්දේශ කර ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග පහ (05) මොනවා ද?

08. ශ්‍රී ලංකාවේ නිවෙස පාදක මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් වල අරමුණු මොනවා ද?

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) විශේෂ අවශ්‍යතා සහිත ළමුන් කාණ්ඩ දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 06)

(ii) දෘශ්‍යමාන සහ අදෘශ්‍යමාන දුබලතා විස්තර කරන්න. (ලකුණු 06)

(iii) "ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපන ක්‍රමය විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා ප්‍රමාණවත් අධ්‍යාපන අවස්ථා සපයා ඇත."
ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

10. (i) ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය සඳහා දායක වූ දාර්ශනිකයන් හතර (04) දෙනෙකු ලැයිස්තු ගත කරන්න. (ලකුණු 04)

(ii) ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳ දාර්ශනිකයන් දෙදෙනෙකුගේ අදහස් පැහැදිලි කරන්න. (ලකුණු 16)

11. "ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් ළමා කේන්ද්‍රීය අධ්‍යාපනයට මාරුවීම වැදගත් කරුණකි."

(i) "ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය" යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් ළමා කේන්ද්‍රීය අධ්‍යාපනයට මාරුවීම වැදගත් වන්නේ ඇයි ? (ලකුණු 06)

(iii) ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය සහ ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 09)

12. "ශ්‍රී ලංකාව තුළ අනිවාර්ය පාසල් පැමිණීමේ වයස ඉහළ දමා ඇත."

(i) ශ්‍රී ලංකාවේ අනිවාර්ය පාසල් පැමිණීමේ වයස් සීමාව කුමක් ද? (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ දරුවන්ට අනිවාර්ය පාසල් කාලය තුළ පාසල් නොපැමිණීමට බලපාන සාධක මොනවා ද? (ලකුණු 08)

(iii) පාසල් නොයන දරුවන්ගේ ගැටලු විසඳීමට ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 08)

13. Covid-19 වසංගතය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරිසර පද්ධතියට දැඩි ලෙස බලපා ඇත.

(i) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයට Covid-19 වසංගතයේ බලපෑම ලැයිස්තු ගත කරන්න. (ලකුණු 10)

(ii) එම බලපෑම් ජය ගැනීමට ඔබේ නිර්දේශ යෝජනා කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.